(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 14.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 ජූනි 20 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

**ගරු රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

**ගරු සාගල රත්නායක මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වීරකුමාර දිසානායක මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු කේ. කාදර් මස්තාන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා උතුරු සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අංගජන් රාමනාදන් මහතා,** කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"පාර්ලිමේන්තුවේ 125 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධාන ප්‍රකාරව සම්බන්ධීකරණ කාරක සභාව :

කථානායකවරයාගේ සභාපතිත්වය ඇතිව;

නියෝජ්‍ය කථානායකවරයා;

නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;

ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා;

විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා; සහ

ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරයන්ගෙන් සමන්විතව ගරු කථානායකවරයා විසින් පත් කරන ලදී"

**II**

"පාර්ලිමේන්තුවේ 118 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි 22 වැනි දින, පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව 2018 ජූනි 19 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන්, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු තිලක් මාරපන මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය"

**III**

"පාර්ලිමේන්තුවේ 117 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි 22 වැනි දින, පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව කථානායකවරයාගේ සභාපතිත්වය ඇතිව 2018 ජුනි 19 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන්, ගෘහ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු මහින්ද අමරවීර මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු කංචන විජේසේකර මහතා"

**IV**

"පාර්ලිමේන්තුවේ 111 වැනි ස්ථාවර නියෝගයෙහි (22) (අ) ඡේදයෙහි විධිවිධාන අනුව සහ 2018 ජුනි 19 වැනි දින තේරීම් කාරක සභාව විසින් නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය පිණිස ගරු කරුණාරත්න පරණවිතාන මහතා පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්; සහ

(ii) 2017 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ තැපැල් ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුනි 07 දිනැති අංක 2074/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා පිළිගන්වා, එම ව්‍යවස්ථා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : (1) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු වේලු කුමාර් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය සහ 24අ(1) වගන්තිය යටතේ නියමයන්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) සුරාබදු ආඥාපනත යටතේ සුරාබදු නිවේදනය; සහ

(ii) වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) වාවකච්චේරි, කල්වයල්, ශ්‍රී ශන්මුගනාදන් විදුහල අසල පදිංචි කේ. රාජේන්ද්‍රම් මහතාගෙන් ලැබුණු 2018.04.28 දිනැති පෙත්සම; සහ

(ii) යාපනය, අම්මාන් පාර, අංක 75 දරන ස්ථානයෙහි පදිංචි ආචාර්ය ශ්‍රීරංගනාදන් දර්ශනන් මහතාගෙන් ලැබුණු 2018.05.15 දිනැති පෙත්සම

ගරු ඩග්ලස් දේවානන්ද මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මොන්නැකුලම, "චන්දි" යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. සෝමවතී බණ්ඩාර මැණිකේ මහත්මියගෙන් ලැබුණු 2017.11.01 දිනැති පෙත්සම ගරු දයාසිරි ජයසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) පදියතලාව, වැලිකුඹුර, නවගම්මානය, අංක 262 ඩී දරන ස්ථානයෙහි පදිංචි කේ. එච්. එම්. අබේරත්න මහතාගෙන් ලැබුණු 2018.02.06 දිනැති

පෙත්සම ගරු විමලවීර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) වේයන්ගොඩ, බණ්ඩාරනායක පාර, අංක 536/2 දරන ස්ථානයෙහි පදිංචි එම්. පී. ලලිත් පද්මසිරි මහතාගෙන් ලැබුණු 2017.11.11 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) කිබිස්ස, ලේනව, "මිහිර" යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. යූ. බී. ලේනව මහතාගෙන් ලැබුණු 2018.03.20 දිනැති පෙත්සම;

(ii) කුලියාපිටිය, මුණමල්දෙණිය, "කරඹවත්ත" යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. තිලකරත්න මහතාගෙන් ලැබුණු 2018.03.06 දිනැති පෙත්සම;

(iii) අඟුණකොළපැලැස්ස, මුලනගොඩ පාර, තලාවේ ගෙදර, අංක 43 දරන ස්ථානයෙහි පදිංචි අයි. කේ. මිල්ටන් මහතාගෙන් ලැබුණු 2018.03.09 දිනැති පෙත්සම;

(iv) මාදම්පේ, දන්සැල වත්ත, කුරුණෑගල පාර, "ශ්‍රී කෙත" යන ලිපිනයෙහි පදිංචි කේ. එච්. ද එස්. විජයරත්න මහතාගෙන් ලැබුණු 2017.12.15 දිනැති පෙත්සම;

(v) මහනුවර, මූලස්ථාන පොලීසිය, ප්‍රධාන පොලිස් පරීක්ෂක එල්. ඒ. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු 2018.01.04 දිනැති පෙත්සම;

(vi) මහරගම, මහමේසාරාම පාර, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි එම්. කේ. ඩී. දේශප්‍රිය මහතාගෙන් ලැබුණු 2018.05.05 දිනැති පෙත්සම;

(vii) දර්ගා නගරය, ජෙයිලානි පාර, අංක 48/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. එම්. තාසිම් මහතාගෙන් ලැබුණු 2018.03.08 දිනැති පෙත්සම;

(viii) වලස්මුල්ල, බෝවල, ගොඩැල්ලවත්ත, අංක 211/1 දරන ස්ථානයෙහි පදිංචි සීතා සිරිවර්ධන මහත්මියගෙන් ලැබුණු 2018.04.20 දිනැති පෙත්සම; සහ

(ix) නාඋල, කණුමුලයාය, ජනඋදානගම, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි යූ. ජී. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු 2018.03.27 දිනැති පෙත්සම

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

(6) මහනුවර, ජෝර්ජ් ඊ. ද සිල්වා මාවත, අංක 309/2 දරන ස්ථානයෙහි පදිංචි ජෙරම් වනිගසේකර මහතාගෙන් ලැබුණු 2018.03.17 දිනැති පෙත්සම ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් පිළිගන්වන ලදී.

(7) මඩකලපුව, කල්ලඩි, "රාමක්‍රිෂ්ණපුරම්" යන ලිපිනයෙහි පදිංචි කේ. මල්ලිකා මහත්මියගෙන් ලැබුණු 2018.01.27 දිනැති පෙත්සම ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) :** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— රජයට හෝ රජයේ නියෝජ්‍යායතනයකට අයිති ඇතැම් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2018 ජූලි 03 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— මතු දැක්වෙන පරිදි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා හතළිස් තුනක් (43) පත් කළ යුතු ය.

1. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
2. මහවැලි සංවර්ධන හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
3. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
4. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
5. බුද්ධශාසන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
6. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
7. මුදල් හා ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
8. විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
9. නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
10. රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
11. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
12. වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
13. ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
14. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
15. අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
16. කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
17. මහානගර හා බස්නාහිර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
18. කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
19. වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
20. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
21. වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
22. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

23. සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
24. මහාමාර්ග හා මාර්ග සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
25. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
26. උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
27. නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
28. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
29. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
30. ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
31. කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
32. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
33. අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
34. නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
35. තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
36. තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
37. ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
38. විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
39. සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
40. පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
41. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
42. තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
43. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

අංක 112 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය අනුව කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා එක් එක් උපදේශක කාරක සභාව මන්ත්‍රීවරයන් අටදෙනෙකුගෙන් (8) සමන්විත විය යුතුය.

එක් එක් උපදේශක කාරක සභාවක ගණපූරණය සඳහා මන්ත්‍රීවරයන් තුන් දෙනෙකු (3) අවශ්‍ය විය යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2018.06.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(2)හි සඳහන් "පූ. භා. 10.30" යන වචන වෙනුවට "පූ. භා. 10.00" යන වචන යෙදීමෙන් එම ස්ථාවර නියෝගය මෙම සභාවාරය තුළ දී ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ. භා. 2.52 ට නියෝජ්‍ය කාරක සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.00 ට ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.58 ට ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.35 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

(අ. භා. 6.02 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

ගරු සිසිර ජයකොඩි මහතා යෝජනා කළ සංශෝධනයක් :

> " පනතේ 2 (අ)/2(a) සයිටම් ආයතනයේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයින් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමට සමගාමීව සයිටම් වෛද්‍ය විද්‍යා ආයතනය අහෝසි කළ යුතුය.;"

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> " 'එම්.බී.බී.එස්. උපාධිය' යන්නෙන් වෛද්‍යවේදී හා ශල්‍යවේදී' "

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු සිසිර ජයකොඩි මහතා යෝජනා කළ සංශෝධනයක් :

> " පනතේ 2 (ඇ) සහ (ඇ)/2 (C) සහ (D) හි අන්තර්ග්‍රහණය කරන ලද සයිටම් ශිෂ්‍යයින් සම්බන්ධයෙන් MBBS (KDU) උපාධි ලබා දීම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) අනුමතියට යටත්ව කොතලාවල විශ්වවිද්‍යාලයේ කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදුකළ යුතුය." ;

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය සභා සම්මත විය.

අලුත් වගන්තිය

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 12 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

| | |
|---|---|
| "සයිටම් හි වෛද්‍ය පීඨය ක්‍රියාත්මක වීම අවසන් වීම. | 3.වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් පරිදි ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කිරීම සම්පූර්ණ කරනු ලැබූ ඉක්බිතිවම සයිටම් හි වෛද්‍ය පීඨය එම්.බී.බී.එස්. උපාධිය ප්‍රදානය කිරීම සඳහා වූ සුදුසුකම අවසන් විය යුතු අතර, එකී වෛද්‍ය පීඨය ක්‍රියාත්මක වීම ද අවසන් විය යුතුය.". |

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

" වගන්තිය, දෙවැනිවර කියවිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

" වගන්තිය, පනත් කෙටුම්පතට එකතු කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

දීර්ඝ නාමය

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : දීර්ඝ නාමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය කොටස ආදේශ කිරීමට,—

> " ජාතික අවශ්‍යතාවයකින් යුතු කාරණාවක් ලෙස දකුණු ආසියාතික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනයෙහි ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත මඟින් පිහිටුවන ලද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**9. කල් තැබීම (මඩකලපුව දිස්ත්‍රික්කයේ රජයේ ගොඩනැගිලිවලින් ආරක්ෂක හමුදා ඉවත් කිරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි, පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ. භා. 6.25 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අද දින සභා සම්මතිය අනුව, අ. භා. 7.13 ට, 2018 ජූනි 21 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.